# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2109/32 - 2019 පෙබරවාරි මස 08 වැනි සිකුරාදා - 2019.02.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව

**දකුණු පළාත් සභාවේ වාරිමාර්ග ප්‍රඥප්තිය**

දකුණු පළාත් සමුපකාර අමාත්‍ය උඩලමත්ත ගමගේ දයාවංශ ආරියතිලක වන මම මෙහි පළ කරනු ලබන 2019 අංක ....... දරන දකුණු පළාත් සභාවේ වාරිමාර්ග ප්‍රඥප්ති කෙටුම්පත මෙම *ගැසට් පත්‍රයේ* පළකරන දිනයේ සිට සති දෙකක් ඉකුත් වීමෙන් පසු දකුණු පළාත් සභාවට ඉදිරිපත් කරන බව මෙයින් නිවේදනය කරමි. යම් අයෙකුට මෙම ප්‍රඥප්තියේ අඩංගු විධිවිධාන පිළිබඳව ඉදිරිපත් කිරීමට යම් කරුණු හෝ සංශෝධන ඇත්නම් එම කරුණු හෝ සංශෝධන එම කාලය තුළ මා වෙත ඉදිරිපත් කළ හැක .

**උඩලමත්ත ගමගේ දයාවංශ ආරියතිලක,**
දකුණු පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග,
ජල සම්පාදන හා ජලාපවහන, ආහාර සැපයුම් හා බෙදාහැරීම්
වෙළෙඳ සහ සමුපකාර සංවර්ධන අමාත්‍ය.

2019 ජනවාරි මස 23 වැනි දින,
ගාල්ල,
දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍ය කාර්යාලයේ දී ය.


1A - PG 4384 — 10 (2019/02)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**2019 අංක ......... දරන දකුණු පළාත් වාරිමාර්ග ප්‍රඥප්තිය**

පූර්විකාව

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 ව්‍යවස්ථා සංශෝධනයේ 09 වන උප ලේඛනයේ 01 වන ලැයිස්තුවේ 19 වන ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා දකුණු පළාතේ අන්තර් පළාත් වාරිමාර්ග යෝජනාක්‍රම හෝ අන්තර් පළාත් වාරිමාර්ග සහ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම හැර සියලු වාරිමාර්ග වැඩ හා සම්බන්ධ ක්‍රම සම්පාදනය, ඒවා සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ නඩත්තු කිරීම පිණිස ද ඊට අදාළවන කාර්ය කටයුතු පහසු වනු පිණිස දකුණු පළාත් වාරි සංවර්ධන අරමුදල නම් වූ අරමුදලක් පිහිටුවීම පිණිස ද ඊට ආනුශාංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ ප්‍රඥප්තියකි.

මෙම ප්‍රඥප්තිය මගින් 1951 අංක 01 දරන වාරිමාර්ග (සංශෝධිත) පනත, 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධිත) පනත, 1973 අංක 37 දරන වාරිමාර්ග (සංශෝධිත) පනත, 1983 අංක 23 දරන වාරිමාර්ග (සංශෝධිත) පනත, 1990 අංක 34 දරන වාරිමාර්ග (සංශෝධිත) පනත, 1994 අංක 13 දරන වාරිමාර්ග (සංශෝධිත) පනත යන පනත්වලින් සංශෝධිත 1948 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනත අනනුකූල කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය

1. මෙම ප්‍රඥප්තිය 2019 අංක ...... දරන දකුණු පළාත් වාරිමාර්ග ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

ක්‍රියාත්මක වන දිනය

2. දකුණු පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලත් දින සිට මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන්නේය.

## I වන පරිච්ඡේදය

දෙපාර්තමේන්තුව පිහිටුවීම.

3 මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම උදෙසා (මෙහි මින්මතු දෙපාර්මේන්තුව නමින් හඳුන්වනු ලබන) දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවක් පිහිටුවනු ලැබේ.

දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු පත් කිරීම.

(1) මෙම ප්‍රඥප්තිය යටතේ දෙපාර්තමේන්තුව වෙත පැවරෙන බලතල ක්‍රියාත්මක කිරීම සඳහා (මෙහි මින්මතු අධ්‍යක්ෂවරයා නමින් හඳුන්වනු ලබන) දකුණු පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ යන නාමය යටතේ අධ්‍යක්ෂවරයෙකු පත්කරනු ලබන අතර ඔහු දෙපාර්තමේන්තු ප්‍රධානියා වන්නේය.

දෙපාර්තමේන්තු සංයුතිය

(2) දෙපාර්තමේන්තුවේ කාර්යයභාරය කාර්යක්ෂමව ඉටු කිරීම සඳහාත් කළමනාකරණය පහසු කිරීම සඳහාත් මෙම දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යක්ෂවරයෙක්, ප්‍රධාන වාරිමාර්ග ඉංජිනේරුවරයෙක්, දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරුවරුන් තිදෙනෙක්, වාරිමාර්ග ඉංජිනේරුවරුන් තිදෙනෙක් සහ සහය කාර්ය මණ්ඩලයකින් ද සමන්විත වන්නේ ය.

(3) පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ, අතිරේක පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ තනතුරු පත් කිරීම සම්බන්ධයෙන් 1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධිත) පනතින් සංශෝධිත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වන වගන්තියේ විධිවිධාන අදාළ වන්නේය.

ලේකම්වරයාගේ විධානයන්ට යටත්වන බව

4. අධ්‍යක්ෂවරයා පළාත් වාරිමාර්ග විෂයභාර ලේකම්වරයාගේ සාමාන්‍ය පරිපාලනයට හා විධානයන්ට යටත් ව ක්‍රියා කළ යුතු වන්නේය.

## II වන පරිච්ඡේදය

අධ්‍යක්ෂවරයා සතු බලතල

5. අධ්‍යක්ෂවරයාට පහත සඳහන් බලතල පවතින්නේ ය:

(1) පළාත තුළ පවතින වාරිමාර්ග ක්‍රම වඩාත් ඵලදායි අයුරින් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(2) පළාත තුළ නව වාරිමාර්ග ක්‍රම වඩාත් ඵලදායි අයුරින් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(3) වාරි ක්‍රම පුනරුත්ථාපනය, නඩත්තුව හා සංරක්ෂණය සඳහා ගොවි ජනතාවගේ සහභාගිත්වය ලබා ගැනීම

(4) වාරි ක්‍රම, වාරි රක්ෂිත වලට හානි පමුණුවන පුද්ගලයින් නීතිය හමුවට පැමිණවීමට කටයුතු කිරීම, ඊට අදාළ චෝදනා පැමිණිලි කිරීම හා අභිචෝදනා ඉදිරිපත් කිරීම

(5) වාරි රක්ෂිත ප්‍රදේශ සිතියම් ගත කිරීම හා ප්‍රකාශයට පත් කිරීම

(6) වාරික්‍රම අබලන්වීම හා විනාශවීමට තුඩුදෙන පාරිසරික හානි වැලැක්වීම, අවම කිරීම හා ඒ සඳහා පරිසර පද්ධතිය සංවර්ධනය කිරීම.

(7) ගංවතුර මගින් සිදුවන හානි අවම කිරීම සඳහා නිර්මිත ඉදිකිරීම හා නඩත්තුව සඳහා අවශ්‍ය පියවර ගැනීම.

(8) කරදිය කුඹුරු බිම් කරා ගලා ඒම මගින් සිදුවන හානි අවම කිරීම සඳහා නිර්මිත ඉදිකිරීම හා නඩත්තුව සඳහා අවශ්‍ය පියවර ගැනීම.

(9) වාරි පද්ධති සංවර්ධන කමිටු අධීක්ෂණය සඳහා නිලධාරීන් පත් කිරීම.

(10) මෙම ප්‍රඥප්තියේ කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා පූර්ව දැනුම් දීමකින් අනතුරුව යම් පරීක්ෂා කිරීමක් වෙනුවෙන්, සංවර්ධනය කිරීම වෙනුවෙන්, නඩත්තු කිරීම වෙනුවෙන් යම් දේපළකට ඇතුළත් වීම.

6. අධ්‍යක්ෂවරයා සතු බලතල අධ්‍යක්ෂවරයා විසින් ලිඛිතව අතිරේක පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂකට, ප්‍රධාන වාරිමාර්ග ඉංජිනේරුවරයාට පවරා දිය හැකිය. අධ්‍යක්ෂවරයා සතු බලතල පැවරීම.

7. අධ්‍යක්ෂවරයාගේ කාර්යය හා කර්තව්‍යයන් පහත සඳහන් ආකාරයට වන්නේය. අධ්‍යක්ෂවරයාගේ කාර්යය හා කර්තව්‍ය.

(1) දකුණු පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂවරයා විසින් ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටමින් දෙපාර්තමේන්තුවේ විෂයය පථයට අයිතිවන සියළුම වර්ගයේ වාරික්‍රම හඳුනා ගැනීම, ලේඛණ ගත කිරීම, සිතියම් ගත කිරීම හා ප්‍රකාශයට පත් කිරීම.

එසේ වුවද ප්‍රකාශයට පත් කරන ලද නිවේදනයට ඇතුළත් වාරික්‍රම වෙනස් කිරීමකට හෝ අලුතින් ඇතුළත් කිරීමකට හේතු වන්නේ නම් එකී වෙනස් කිරීම හෝ ඇතුළත් කිරීම අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව අධ්‍යක්ෂවරයා විසින් ප්‍රකාශයට පත් කළ යුතුය.

(2) පළාත් වාර්මාර්ග පද්ධතිය, නව ඉදිකිරීම්, පුනරුත්ථාපනය කිරීම, සංවර්ධනය කිරීම හා සංරක්ෂණය කිරීම සඳහා වාර්ෂිකව, කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන සැලසුම් සකස් කිරීම.

(3) පිළියෙල කරන ලද සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට පෙර පළාත් සැලසුම් කමිටුව වෙත හෝ ප්‍රධාන ලේකම්වරයා වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගැනීම.

(4) පළාත් වාරි යෝජනා ක්‍රමයක් සඳහාම වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටුව නමින් කමිටුවක් යාය මට්ටමින් පිහිටුවා පවත්වාගෙන යාම හා ලියාපදිංචිය.

(5) වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටු නියෝජනය වන පරිදි වාරි පද්ධති සංරක්ෂණ හා සංවර්ධන කමිටුව නමින් වාරි පද්ධතියටම අදාළ වන කමිටු පිහිටුවා පවත්වාගෙන යාම හා ලියාපදිංචිය.

## III වන පරිච්ඡේදය

8. දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් සෑම පළාත් වාරි යෝජනා ක්‍රමයන් සඳහාම වාරි සංරක්ෂණය හා සංවර්ධන කමිටුව නමින් කමිටුවක් යාය මට්ටමින් පිහිටුවිය යුතුය. යාය මට්ටමේ කමිටු පිහිටුවීම, සාමාජිකත්වය, සණ පූර්ණය, ව්‍යවස්ථාව හා කාර්යයන්

(1) වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටුවක සාමාජිකයෙකු වීම සඳහා පහත සඳහන් සුදුසුකම් විය යුත්තේය. සුදුසුකම්

(අ) කෘෂි කර්මාන්තය ප්‍රධාන ජීවිකාව කරගත් තැනැත්තෙක් වීම.

(ආ) වයස අවුරුදු දහඅටට නොඅඩුවීම.

(ඇ) තමා සාමාජිකත්වය අපේක්ෂා කරන වාරි සංරක්ෂණය හා සංවර්ධන කමිටු බල ප්‍රදේශයේ ස්ථිරව පදිංචිව සිටීම හෝ අවුරුදු දෙකකට වැඩි කාල පරිච්ඡේදයක් සඳහා ඒ බල ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු වල නිරත වී සිටීම.

ආශ්‍රිත සාමාජිකයෙකුගේ සුදුසුකම්

(2) වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටුවක ආශ්‍රිත සාමාජිකයෙකු වීම සඳහා පහත සඳහන් සුදුසුකම් විය යුත්තේය.

(අ) තම ප්‍රධාන ජීවිකාව කෘෂිකර්මාන්තය නොවුනේ වුවද, කමිටු බල ප්‍රදේශය ඇතුළත කෘෂිකාර්මික ඉඩමක හිමිකරු හෝ පදිංචිකරුවකු හෝ භුක්තිකරුවකු වීම.

(ආ) කෘෂිකර්මයට අදාළ නිෂ්පාදනයක හෝ කෘෂිකාර්මික නිෂ්පාදන හා භාණ්ඩ අලෙවියෙහි නිරත වන අයකු වීම

(3) දකුණු පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ අනුමැතියට යටත්ව හා මෙම කමිටු සාමාජිකත්වයේ එකඟත්වය මත වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටුවේ උපදේශකවරයා ලෙස අදාළ ප්‍රදේශය භාර කෘෂිකර්ම උපදේශකවරයා පත් කර ගත හැකිය.

(4) මෙසේ පිහිටුවාගත් කමිටුවේ රැස්වීම් පැවැත්වීම සඳහා මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක සන පූර්ණයක් විය යුතු ය.

(5) සෑම වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටුවක් අධ්‍යක්ෂකවරයා විසින් අනුමත කළ ව්‍යවස්ථාවකට අනුව ක්‍රියා කළ යුතුය.

වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටුවේ කාර්යයන්

9. වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටුවක කාර්යයන් පහත සඳහන් ආකාරයට වන්නේය.

(1) සෑම වාරි සංරක්ෂණය හා සංවර්ධන කමිටුවක් විසින්ම ස්වකීය බල ප්‍රදේශය තුළ ඇති එල්ලංගාව, වැව්, අමුණු හා ඇළ මාර්ග, බුබුල් ආශ්‍රිතව සිදුකල යුතු නඩත්තු කටයුතු දෙපාර්තමේන්තුව වෙත දනුම්දීම හා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සිදු කිරීම.

(2) වාරි කළමනාකරණ කටයුතු නිසි කලට වේලාවට කරනු ලබන බවට වග බලා ගැනීම.

(3) වාරි කර්මාන්ත වලින් සැපයෙන ජලය හා කෘෂිකාර්මික කටයුතු සඳහා ප්‍රයෝජනයට ගන්නා ජලය, කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය සහයෝගය අදාළ ආයතන තුළින් ලබා දීමට කටයුතු කිරීම.

(4) කෘෂිකාර්මික ඉඩම්වල හෝ කුඹුරුවල හෝ වී වගා කිරීම නැතහොත් වෙනත් ආකාරයක භෝග වගා කිරීම සඳහා ධෛර්ය දීම පිණිස ගොවි සංවිධාන වලට අවශ්‍ය සහාය ලබාදීම.

(5) වී වගා කිරීම හෝ වෙනත් ආකාරයේ වගා කිරීම් වලට අදාළ චාරිත්‍ර වාරිත්‍ර සිදුකිරීම සඳහා ගොවි සංවිධාන වලට අවශ්‍ය සහාය ලබාදීම හා පෙළඹවීම

(6) පස සංරක්ෂණය කිරීම සඳහා පලිබෝධ වලින් හා රෝග වලින් ආරක්ෂා කිරීමට පියවර ගැනීම.

යාය නියෝජිතයා පත් කිරීම හා ධුර කාලය

10. (1) වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටුවේ සාමාජිකයින්ගේ වැඩි කැමැත්තෙන් ''යාය නියෝජිතයා'' නමින් අයෙකු තෝරා පත්කර ගත යුතු අතර ඔහු වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටුවේ නිලයක් දරන්නෙකු හෝ සාමාජිකයෙකු විය හැකිය.

(2) පත්වන යාය නියෝජිතයකු පත් කරන ලද දින සිට ඉවත් නොකරන තාක් වසර 3ක කාලයක් ධූරය දැරිය හැකිය.

යාය නියෝජිතයා ඉවත් කිරීම හෝ ඉල්ලා අස්වීම

11. ඉහත 10 වගන්තිය යටතේ පත්වනු ලබන යාය නියෝජිතයාගේ ධූර කාලය පහත අවස්ථා යටතේ හිස් වන්නේය.

(1) යාය නියෝජිතයා මිය යාම

(2) අධ්‍යක්ෂවරයා වෙත යවනු ලබන ඉල්ලා අස්වීමේ ලිපියක් හා එය පිළිගනු ලැබූ බවට අධ්‍යක්ෂවරයා කරනු ලබන දනුම් දීමකින්.

(3) අකාර්යක්ෂමතාවය හෝ අකටයුතුකම් පදනම් කරගෙන අධ්‍යක්ෂවරයා විසින් කරන ලද පරීක්ෂණයකින් හෙලි වූ කරුණු පදනම් කරගෙන ඉවත් කිරීමකින්

(4) වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටුවේ සමස්ථ සාමාජිකත්වයෙන් තුනෙන් දෙකක බහුතර ඡන්දයක් සහිත යෝජනා සම්මතයකින්

12. (1) ඉහත 11 වගන්තියේ (2) හා (3) උප වගන්ති යටතේ කරනු ලබන ඉවත් කිරීමක් සම්බන්ධයෙන් වන අභියාචනයක් ඉවත් කරනු ලබන දින සිට දින 30ක් ඇතුළත ලේකම් වෙත එසේ ඉවත් කිරීමට ලක්වූ අය විසින් ලිඛිතව ඉදිරිපත් කළ හැකි අතර එසේ ඉදිරිපත්වන අභියාචනයක් සම්බන්ධයෙන් ලේකම්ගේ තීරණය අවසානාත්මක විය යුතුය. ඉවත් කිරීම සම්බන්ධයෙන් වන අභියාචනා

(2) මෙහි පළවන උපවගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කර ඊට අදාල තීරණය ලේකම් විසින් දැනුම් දෙන තෙක් හෝ ඉවත් කිරීම සිදුවී දින 30ක කාල සීමාවක් ගතවන තෙක් වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටුවක් විසින් යාය නියෝජිතයෙකු පත් කර ගැනීම අත්හිටුවිය යුත්තේය.

13. යාය නියෝජිතයාගේ කාර්යයන් පහත ආකාරයෙන් විය යුතුය.

(1) තම බල ප්‍රදේශයේ වාරිමාර්ග ආරක්ෂා කිරීම, වාරි ක්‍රමවලට හානි පමුණුවන්නන් නීතිය ඉදිරියට ගෙන යාමට අවශ්‍ය සහයෝගය දෙපාර්තමේන්තුවට ලබාදීම, වාරි ජලාශවල හා අනෙකුත් වාරික්‍රමවලින් නිකුත් කෙරෙන ජලය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම, වගා සැලසුම් කාල සටහන්වලට අනුව වගා වැඩසටහන් ගෙන යාම හා මෙහෙයවීම සඳහා සහය දීම. යාය නියෝජිතයාගේ කාර්යයන්

(2) අවශ්‍ය සෑම අවස්ථාවකදීම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් තම බල ප්‍රදේශයට අදාළව පවත්වාගෙන යන කුඹුරු නාම ලේඛනයට අනුකූලව අවශ්‍ය ක්‍රියා සිදු කිරීම.

(3) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කුඹුරු නාම නාමලේඛනයෙහි එක් එක් ඉඩම් හිමියාට හෝ භුක්තිකරුට හිමිවන කුඹුරු ඉඩම්වල වපසරියට හා පංගුවට අනුගතව ඔවුන් වෙත ප්‍රධාන වාරි වේල්ල හා ප්‍රධාන බෙදුම් ඇල වෙන්කොට ඊට අනුගතව ජල පරිහරණය යථා පරිදි සිදුවන අයුරින් භාරදීම හා එසේ භාර දීමට අදාළව ක්‍රියාත්මක විය යුතු ආකාරය සම්බන්ධයෙන් අදළ පාර්ශ්වය සමග ලියවිල්ලකට එළැඹීම.

(4) යාය නියෝජිතයා විසින් එක් එක් ඉඩම් හිමියාට හෝ භුක්තිකරු බෙදා බාරදුන් කොටස අධ්‍යක්ෂවරයාගේ සහය ඇතිව සුදුසු ක්‍රමයක් යටතේ මායිම් සලකුණු කර දීම.

(5) සෑම කන්නයක් ආරම්භ වීමට ප්‍රථම අදාළ පාර්ශ්වය වෙතින්, සලකුණු කරනු ලබන කොටසේ වැඩී ඇති කටු පඳුරු සහිත කැළය ඉවත් කොට පස සෝදී යාම නිසා හානි වී ඇති බැම්මේ කොටස්, වෙන් කොට ඇති රක්ෂිතයෙන් හෝ බාහිරින් පස් කපා පුරවා මනා සේ සකස් කර පවත්වාගෙන යාමට වගබලා ගැනීම.

14. (1) ඉහත 13 වගන්තියෙහි (3) වන උප වගන්තියේ සඳහන් ලියවිල්ලෙන් වූ එකඟතාවය කඩවන ආකාරයට ක්‍රියා කරන්නේ නම් එසේ ක්‍රියා කිරීම සම්බන්ධයෙන් යාය නියෝජිතයා විසින් අධ්‍යක්ෂවරයා වෙත වාර්තා කළ යුතුය. අධ්‍යක්ෂවරයා විසින් මහෙස්ත්‍රාත්වරයා වෙත කරුණු ඉදිරිපත් කිරීම

(2) අධ්‍යක්ෂවරයා වෙත ඉහත (1) වන උපවගන්තිය යටතේ වන වාර්තා කිරීමක දී එකඟතාවයෙන් බැහැර වී කටයුතු කරන ලද පාර්ශ්වය වෙත දින 7ක් කල් දෙමින් කරනු ලබන දන්වීමකින් අනතුරුව තවදුරටත් ඇළෙහි පංගු කොටස් නඩත්තු කාර්යයන් එකී පාර්ශ්වය විසින් ඉටු නොකරන්නේ නම් ඒ සම්බන්ධයෙන් ඊට අදාළ වන බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණයේ මහෙස්ත්‍රාත් වෙත අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් නිශ්චිතව බලය පවරන අය වාර්තා කළ යුතු අතර මහෙස්ත්‍රාත්වරයා විසින් එකී වාර්තා කිරීම මත අදාල පාර්ශ්වය කැඳවා ප්‍රධාන නඩත්තු කාර්යය ඉටු කරනු පිණිස වූ සුදුසු නියෝගයක් කරනු ලැබිය හැකිය.

## **IV** වන පරිච්ඡේදය

15. වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටු නියෝජනය කරන වාරි නියෝජිතයන්ගෙන් සැදුම්ලත්වන පරිදි වාරි පද්ධතිවල භෞතික පිහිටීම පදනම් කරගනිමින් වාරි පද්ධතියටම අදාළවන පරිදි වාරි පද්ධති සංවර්ධන කමිටුවක් පිහිටුවිය යුතුය. වාරි පද්ධති සංවර්ධන කමිටු පිහිටුවීම

වාරි පද්ධති සංවර්ධන කමිටු සංයුතිය

16. (1) වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටු නියෝජනය කරන යාය නියෝජිතයන් අතරින් එක් අයෙකු සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යනුවෙන් තිදෙනෙකු සාමාජිකයන් විසින් පත් කර ගත යුතුය.

(2) සෑම වාරි පද්ධති සංවර්ධන කමිටුවක සාමාජිකයන් විසින් එම කමිටුවේ සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන නිලයන් නිත්‍ය සාමාජිකයන් වශයෙන් සෙසු සාමාජිකයන් සිව් දෙනෙකුට නොවැඩි වන සංයුතියක් යටතේ වාරි පදධති සංවර්ධන කමිටුව සඳහා වූ සුදුසු කාරක සභාවක් පත් කර ගත යුතුය.

(3) කමිටුවේ යම් නිලයක් පුරප්පාඩු වූ කල එම නිලය සඳහා සුදුසු යාය නියෝජිතයෙකු නැවතත් සාමාජික ඡන්දයකින් පත්වන තෙක් එකී නිලයට අදාළ වගකීම ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු කමිටුව නියෝජනය කරන සාමාජිකයකු අධ්‍යක්ෂ විසින් පත් කළ යුතු අතර එසේ පත්කරනු ලබන අයගේ ධූර කාලය ධූරය හිස් වූ සාමාජිකයාගේ ඉතිරි වූ ධූර කාලය විය යුතුය.

(4) වාරි පද්ධති කමිටුවේ නිලයක් දරන්නෙකුගේ ධූරයේ කටයුතු සම්බන්ධයෙන් විරෝධතාවයන් පැන නැගී ඇති අවස්ථාවක එකී ධූරයෙන් ඔහු ඉවත් කළයුතු බවට වාරි පද්ධති සංවර්ධන කමිටුවෙහි සාමාජිකයන්ගේ 2/3 ක ඡන්දයකින් යෝජනාවක් සම්මත කර අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කල හැකි අතර එවැනි අවස්ථාවකදී අධ්‍යක්ෂ විසින් ඒ සම්බන්ධයෙන් සුදුදු තීරණයක් ගත යුතුය.

වාරි පද්ධති සංවර්ධන කමිටුවේ කාර්යයන්.

17. වාරි පද්ධති සංවර්ධන කමිටුවේ කාර්යයන් පහත සඳහන් ආකාරයට වන්නේය.

(1) තම වාරි පද්ධතියේ සංරක්ෂණය සඳහා කටයුතු කිරීම,

(2) පුනරුත්ථාපනය, සංවර්ධන කටයුතු වලදී පද්ධතියේ වාරිමාර්ග ව්‍යාපාර වලට දිය යුතු ප්‍රමුඛතාවය සම්බන්ධයෙන් අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම,

(3) පද්ධතිය පුරා පිහිටි වාරි රක්ෂිත හා පෝෂිත ප්‍රදේශ ආරක්ෂා කිරීම,

(4) පද්ධතියේ සියලු වාරි ක්‍රම හා ජල ප්‍රවාහන ප්‍රදේශ ආරක්ෂා කිරීමට සහය විම,

(5) පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනුමත පද්ධති සැලැස්මට අනුව වාරි පද්ධතියක් තුළ තිබිය යුතු අංගෝපාංග හා රක්ෂිත ආරක්ෂා කිරීමට දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට සහය වීම,

18. සෑම වාරි පද්ධති සංවර්ධන කමිටුවක් ම අධ්‍යක්ෂවරයා විසින් ලියාපදිංචි කළ යුතුය.

19 (1) සෑම වාරි පද්ධති සංවර්ධන කමිටුවක්විසින් කමිටුව නමින් රජය පිළිගත් බැංකුවක් යටතේ ගිණුමක් පවත්වාගෙන යා යුතුය.

(2) කමිටු විසින් පවත්වගෙන යනු ලබන ගිණුම අධ්‍යක්ෂ විසින් බලය පවරන ලද අයකු විසින් විගණනය කළ යුතු අතර විගනනය පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂයක් අරමුණු කර ගනිමින් අනුගාමී වර්ෂයේ මාර්තු 31 ට පෙර කමිටුවේ සභාපති විසින් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

කෘෂිකාර්මික නොවන වාණිජ පරමාර්ථයක් සඳහා වාරි ජලය භාවිතා කිරීම

20. කිසියම් වාරි යෝජනා ක්‍රමයක් යටතේ කෘෂිකාර්මික නොවන වාණිජ පරමාර්ථයක් සඳහා අධ්‍යක්ෂවරයාගේ අනුමැතියකින් තොරව කවර තැනැත්තෙක් හෝ වාරි ජලය මුදාගැනීමක් සිදු නොකළ යුතුය.

කිසියම් වාරි පද්ධතියක් යටතේ කෘෂිකාර්මික නොවන වාණිජ පරමාර්ථයන් සඳහා ජලය මුදාහැරීමක් සඳහා අධ්‍යක්ෂවරයා විසින් අනුමැතිය ලබා දෙන්නේ නම් ඒ සඳහා අයකළ යුතු ගාස්තු මෙම ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන නියෝග මගින් නියම කරනු ලබන ආකාරයට විය යුතුය.

## V වන පරිච්ඡේදය

පළාත් වාරි සංවර්ධන අරමුදල සංස්ථාපනය

21. මෙම ප්‍රඥප්තියේ පරමාර්ථයන් සඳහා කටයුතු කිරීම පහසු වනු පිණිස පළාත් වාරිමාර්ග සංවර්ධන අරමුදල නම් වූ අරමුදලක් මෙයින් පිහිටු වනු ලබයි.

22. (1) ඉහත 21 වන වගන්තිය යටතේ සංස්ථාපනය කරන ලද අරමුදල එම අරමුදල නමින් සංස්ථාවක් විය යුතු අතර ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර අරමුදලේ නමින් නඩු පැවරීමට හා පවරනු ලැබීමට යටත් විය යුතුය.

(2) (මෙහි මින්මතු අරමුදල නමින් හඳුන්වනු ලබන) පළාත් වාරි සංවර්ධන අරමුදල නිල බලයෙන් පත්වන පහත සඳහන් සාමාජිකයන්ගෙන් සැදුම්ලත් පාලක මණ්ඩලයකින් සමන්විය විය යුතු ය.

එනම්

(අ) දකුණු පළාත් වාරිමාර්ග විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්,
(ආ) දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් හා මෙහෙයුම්),
(ඇ) දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්),
(ඈ) දකුණු පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ,
(ඉ) දකුණු පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ,

(3) අමාත්‍යාංශයේ ලේකම්, අරමුදලෙහි සභාපතිවරයා වන්නේය.

(4) අරමුදලේ ලේකම්, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වාරිමාර්ග ඉංජිනේරුවරයා විය යුතු ය.

(5) අරමුදලේ ගිණුම් සකස් කිරීම, අරමුදලේ ලේකම්ගේ පරිපාලනයට යටත්ව දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී විසින් කළ යුතු ය.

23. අරමුදලේ අරමුණු පහත පරිදි වේ. — අරමුදලේ අරමුණු.

(1) පළාතේ වාරිමාර්ග ව්‍යාපාරවලට අදාළ වන නඩත්තු හා මෙහෙයුම්, සංවර්ධන, පුනරුත්ථාපන කටයුතු වඩා කාර්යක්ෂමව ඉටු කිරීම.

(2) වාරිමාර්ග ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීම.

(3) ගංවතුර හා කරදිය ගැලීම නිසා සිදුවන ආපදා පාලනය වඩා කාර්යක්ෂමව සිදු කිරීම

(4) වාරිමාර්ග රක්ෂිත සංරක්ෂණය සඳහා පහසුකම් සැලසීම.

(5) වාරි සංරක්ෂණ හා සංවර්ධන කමිටුවල හා වාරි පද්ධති සංවර්ධන කමිටුවල මානව සම්පත වැඩි දියුණු කිරීම

24. (1) දේපලක් දැරීම, බැහැර කිරීම, මිලට ගැනීම, බදු දීම හෝ විකිණීම. — අරමුදලේ බලතල හා කාර්යයන්.

(2) අරමුදලේ අරමුණු යටතට ගතහැකි කවර හෝ කරුණු සම්බන්ධයෙන් වෙනත් පාර්ශ්ව සමග ගිවිසුම් ගත වීම.

(3) අරමුදලේ අරමුණු යටතට ගත හැකි කවර හෝ කරුණු සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘති හඳුනාගැනීම, අනුමත කිරීම හා ක්‍රියාත්මක කිරීම ද, එසේ ක්‍රියාත්මක කිරීමේ දී ඒ සඳහා අවශ්‍යවන ශ්‍රම දායකත්වය හා උපදේශන සේවාවන්.

(4) අරමුදලේ අරමුණු යටතට ගත හැකි කවර හෝ කරුණු සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය කරන භෞතික සම්පත් පහසුකම් හා වෙනත් කවර හෝ සේවාවන් ලබා ගැනීම.

(5) අරමුදලේ අරමුණු යටතට ගත හැකි කවර හෝ කරුණු සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය කරන ශ්‍රම දායකත්වයන් වෙනුවෙන් අදාල වන පාරිශ්‍රමිකයේ නියම කිරීම හා ගෙවීම.

(6) මෙම ප්‍රඥප්තියේ අරමුදලේ අරමුණු යටතට ගත හැකි කවර හෝ කරුණු සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීම හා ඊට අදාලව වියදම් දැරීම.

25. අරමුදලේ ලැබීම් පහත ආකාරයට වන්නේ ය. — අරමුදලේ ලැබීම.

(1) කෘෂි කාර්මික නොවන වාණිජ කටයුතු සඳහා ජලය නිකුත් කිරීමේ දී අය කරනු ලබන ගාස්තු.
(2) රජය මගින් ආධාර වශයෙන් වරින් වර ප්‍රදානය කරනු ලබන මුදල්.
(3) දකුණු පළාත් සභාව විසින් අරමුදල් ගිණුමේ කාර්යයන් සඳහා සම්මත කරනු ලැබිය හැකි මුදල්.
(4) යම් පුද්ගලයෙක්, ආයතනයක් හෝ සංවිධානයක් මඟින් කෙරෙන පළාතේ වාරිමාර්ග දියුණුව සඳහා පරිත්‍යාග වශයෙන් ලැබෙන සියළුම මුදල්.
(5) කමිටු මඟින් සේවා ගාස්තු වශයෙන් ලබා ගන්නා මුදල්.
(6) සංදර්ශන, ලොතරැයි හා වෙනත් සම්මත ක්‍රම මගින් ලබා ගන්නා සියළුම මුදල්.

අරමුදලේ වියදම

26. අරමුදලෙන් කරන වියදම් පහත ආකාරයට වන්නේය.

(1) මෙම ප්‍රඥප්තියේ අරමුණු යටතට ගැනිය හැකි කවර හෝ කාර්යයක් සම්බන්ධයෙන් කළ යුතු වියදම්

(2) අරමුදල නමින් බැඳී ඇති ගිවිසුම් ඉෂ්ඨ කිරීම වෙනුවෙන් කළ යුතු වියදම්, අරමුදල වෙනුවෙන් ලබාගන්නා සේවාවන් හෝ මිලදී ගැනීම් වෙනුවෙන් කරනු ලබන වියදම්

(3) අරමුදල වෙනුවෙන් සපයනු ලබන සේවාවන් වෙනුවෙන් ගෙවිය යුතු පාරිශ්‍රමික හෝ අතිකූත් ගෙවීම්

(4) අරමුදලේ නමින් කළ යුතු වගකීම් ඉෂ්ඨ කිරීමක් වෙනුවෙන් කළ යුතු කවර හෝ වියදම්

27. අරමුදල සඳහා වූ ගිණුම් රජය අනුමත කළ බැංකුවක් යටතේ පවත්වගෙන යා යුතුය.

28. අරමුදලේ මුදල් සඳහා මුදල් වර්ෂය ලිත් වර්ෂයක් විය යුතු අතර සෑම ලිත් වර්ෂයක් සඳහාම වන ආදායම්-වියදම් පිළිබඳ වාර්ෂික ගිණුම් වාර්තාව අනුගාමී වර්ෂයේ මාර්තු 31ට පෙර අරමුදලේ ලේකම් විසින් සකස් කර ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

අරමුදලේ ගිණුම් පවත්වාගෙන යාම හා විගණනය

29. අරමුදලේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අදාල විය යුතුය.

(1) අරමුදලේ පරිපාලනය හා ගිණුම් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අරමුදලේ ලේකම් විසින් සෑම ලිත් වර්ෂයන් සඳහාම පිළියෙල කරනු ලබන වාර්ෂික වාර්තාව අනුගාමී වර්ෂයේ මැයි 31 වන දිනට පෙර සකස් කරන අරමුදලේ පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු අතර පාලක මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ ඇති වාර්තාව එම වර්ෂයේ ජූනි මස 30 වන දිනට පූර්වයෙන් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

(2) අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ අරමුදල සම්බන්ධයෙන් වූ වාර්ෂික පාලන වාර්තාව එම සංවර්ධන අරමුදල් ගිණුමේ විගණනය කරන ලද එම වර්ෂයේ ගිණුම් වල පිටපතක් ද, එම ගණන් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවද සමග දකුණු පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත දකුණු පළාත් සභාව හමුවේ තැබිය යුතුය.

## **VI** වන පරිච්ඡේදය

30. මෙම ප්‍රඥප්තිය යටතේ පහත ක්‍රියා සිදුකිරීම වරදක් වන්නේය.

(1) (අ) අවහිර කරනු ලැබීම.
(ආ) බාධා කරනු ලැබීම
(ඇ) අනවසරයෙන් කොටු කරගනු ලැබීම
(ඈ) බාධා කිරීමට හෝ කොටු කර ගැනීමට කටයුතු සැලැස්වීම
(ඉ) රැස් කොට ඇති ජලය ඕනැකමින් හෝ ද්වේශ සහගතව අපතේ හැරීමට කටයුතු කිරීම
(ඊ) ගස් කැපීම
(උ) අනවසරයෙන් යම් ඉදිකිරීමක් සිදු කිරීම
(ඌ) අනවසරයෙන් වගා කිරීම

(2) යම් වැඩකින්, ජලධාරා ප්‍රදේශයේ පිහිටි ඇලකින්, වාරි කර්මාන්තයකින්, ජල මාර්ගයකින්, බැම්මකින්, ඉවුරකින්,රක්ෂිතයකින්, වේල්ලකින් වැවක ප්‍රවේශයකින් හෝ වාරි කර්මාන්ත සංචිතයකින් අවසරයකින් තොරව ඛනිජ පස් හෝ වැලි ඉවත් කිරීම හෝ ඉවත් කිරීමට සැලැස්වීම.

(3) යම් වාරිමාර්ගයකට, ඇළකට, ජල මාර්ගයකට, වාරි රක්ෂිතයකට, හෝ කුඹුරු ඉඩමකට අපද්‍රව්‍ය මුදා හැරීමට සැලැස්වීම හෝ ගලා යාමට ඉඩ හැරීම හෝ එසේ වන පරිදි වාහන, යන්ත්‍රෝපකරණ වැනි දෑ සේදීම

(4) අධ්‍යක්ෂවරයාගේ ලිඛිත අවසරය මත ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව මිස යම් ඇලක් කැනීම, වැවක් ඉදි කිරීම, නිර්මිත ඉදි කිරීම හෝ පවත්වාගෙන යාම

(5) යම් වාරිමාර්ගයකට ඇලකට, ජල මාර්ගයකට, වාරි රක්ෂිතයකට, හානි සිදුවන සේ අයාලයේ සැරිසැරීමට හැකිවන පරිදි සතුන් මුදහැරීම

(6) පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂවරයාගේ නිසි ලිඛිත අවසරයක් නොමැතිව වැව් තාවුල්ලෙහි වගා කටයුතු කිරීම

(7) කන්න රැස්වීමේදී තීරණය කොට එකඟතාවයකට පැමිණි පසු ඊට පටහැනිව වී, වෙනත් වාරි භෝග හෝ අනවසරයෙන් බහු වාර්ෂික භෝග වගා කිරීම

(8) යම් අයෙකුගේ වාරි අයිතිවාසිකම්වලට, අනිසි ලෙස බලපවත්වන සේ කටයුතු කිරීම

31. ඉහත 30 වගන්තියේ සඳහන් (2) අනු වගන්තිය හැර අනෙකුත් කවර හෝ වරදක් සිදුකිරීම සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු රු. 10,000කට නොඅඩු හා රු. 50,000කට නොවැඩි දඩයකින් හෝ මාස 6කට නොඅඩු හා මාස 12කට නොවැඩි කාලයකට බන්ධනාගාර ගත කිරීම හෝ ඒ දෙයාකාරයෙන්ම දඬුවමකට යටත් විය යුතුය.

32. ඉහත 30 වගන්තියේ (2) අනු වගන්තිය අනුව වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු රු. 50,000කට නොඅඩු හා රු. 100,000 කට නොවැඩි හෝ මාස 6කට නොඅඩු හා මාස 12කට නොවැඩි කාලයකට බන්ධනාගාර ගත කිරීම හෝ ඒ දෙයාකාරයෙන්ම වූ දඬුවමකට යටත් විය යුතුය.

33. මෙම ප්‍රඥප්තිය යටතේ නියෝග සෑදිය යුතු යැයි සඳහන් කරුණු සම්බන්ධයෙන් හා පහත සඳහන් කරුණු ද ඇතුළුව ප්‍රඥප්තියේ අරමුණු යටතට ගැනෙන කවර හෝ කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය යුතුය.

34. දෙපාර්තමේන්තුවේ සියලුම නිලධරයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථ නිරූපනයට අනුකූලව රජයේ නිලධරයන් ලෙස සැළකිය යුතුය.

35. මේ ප්‍රඥප්තියේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල ගැන්විය යුතුය.

36. මේ ප්‍රඥප්තියෙන් පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, අර්ථනිරූපන

(1) ''පළාත් සභාව'' යන්නෙන් දකුණු පළාතේ, පළාත් සභාව අදහස් වේ.

(2) ''අමාත්‍යවරයා'' යන්නෙන් දකුණු පළාතේ, වාරිමාර්ග විෂයභාර අමාත්‍යවරයා අදහස් වේ.

(3) ''ලේකම්වරයා'' යන්නෙන් දකුණු පළාතේ, වාරිමාර්ග විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

(4) ''පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව'' හෝ ''දෙපාර්තමේන්තුව'' යන්නෙන් දකුණු පළාතේ, වාරිමාර්ග විෂයභාර දෙපාර්තමේන්තුව අදහස් වේ.

(5) ''අතිරේක පළාත් අධ්‍යක්ෂ'' යන්නෙන් දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය ප්‍රධානියා අදහස් වේ.

(6) ''කුඹුරු ඉඩම්'' යන්නෙන් මේ ප්‍රඥප්තියේ අර්ථානුකූලව වී වගා කිරීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන හෝ ප්‍රයෝජනයට ගත හැකි ඉඩම් අදහස් වන අතර, පෞද්ගලික ඉඩම් හා ඉඩම් සංවර්ධන ආඥා පනත, රජයේ ඉඩම් ආඥා පනත හා වෙනයම් පනතක් යටතේ අන්සතු කරනු ලැබූ ඉඩම් ද ඊට ඇතුළත් ය.

(7) ''යාය'' යන්නෙන් දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නම් කිරීමෙන් හෝ භාවිතයෙන් සම්මත කරගත් වගා කරන භූමියෙන් ඕනෑම කොටසක් අදහස් වේ.

(8) ''භුක්තිකරු'' යන්නෙන් ඉඩම් හිමියන් හෝ බදුකරු හෝ වෙනත් හේතුවකින් අඳයට ගෙන වගා කිරීම නිසා කෘෂිකාර්මික ඉඩම් වගා කරන තැනැත්තා අදහස් වන අතර ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ හෝ වෙනයම් පනතක් යටතේ හෝ අන්සතු කරනු ලැබූ ඉඩම් ප්‍රයෝජනයට ගන්නා වූ හා භුක්ති විඳින්නා වූ තැනැත්තා ද ඇතුළත් වේ.

(9) ''වාරිමාර්ග වැව'' යන්නෙන් කෘෂිකාර්මික ඉඩම් හිමි නාමලේඛනයට නිත්‍යානුකූලව ඇතුළත් රක්ෂිත, ඇල, දොල, කුඹුරු වලින් සමන්විත වූ වාරිමාර්ග එකක් හෝ කිහිපයකින් සමන්විත ප්‍රදේශයක් අදහස් වේ.

(10) ''එල්ලංගාව හෝ වාරිමාර්ග පද්ධතිය'' යන්නෙන් යම් නිශ්චිත බෑවුම් සහිත ප්‍රදේශයකින් ආරම්භව එක් දිශාවකට ගලා බසින ජල ප්‍රවාහය වර්ෂාව ලැබීම හේතුවෙන් පිටාර යමින් ජලය එකතු වෙමින් ගලා ගොස්, අවසානයේ ප්‍රධාන ගංගාවකට, ඔයකට සම්බන්ධ වීමට ප්‍රථම ජලය එකතු වීමට සලස්වා එම ජලය හසුරුවා ගත හැකි පරිදි ඉදිකර ඇති වාරිමාර්ග නිර්මිත හා ජලය එක් රැස් කරන පෝෂක ප්‍රදේශ, රක්ෂිත, ඇල, දොල, කුඹුරු වලින් සමන්විත වූ වාරිමාර්ග එකක් හෝ කිහිපයකින් සමන්විත ප්‍රදේශයක් අදහස් වේ.

(11) ''සේවා ගාස්තු'' යන්නෙන්, වාරි සංවර්ධන කමිටු විසින් යථෝක්ත සුළු වාරිමාර්ගය අමුණු ඇල වේලි පද්ධතිය ඉදිරියේදී මනා ලෙස පවත්වාගෙන යාම සඳහා යම් යම් අවස්ථාවලදී රජයෙන්, පළාත් සභාවෙන් හෝ වෙනයම් කුමන සංවිධානයකින් මුල්‍ය ප්‍රතිපාදන ලැබුණහොත්, එම ප්‍රතිපාදනයන් ප්‍රමාණවත් නොවීම හෝ නොලැබීම හේතුවෙන් කළයුතු අත්‍යාවශ්‍ය වන්නාවූ පුනරුත්ථාපනයන් සිදු කිරීම සඳහා ආරම්භ කොට පවත්වාගෙන යනු ලබන අරමුදලකට දයක කරගන්නාවූ මේ ප්‍රඥප්තියට අනුකූලව විෂය භාර අමාත්‍යවරයා විසින් රීති, රෙගුලාසි මඟින් නිත්‍යානුකූලව පනවනු ලබන ජල ඒකකයේ ප්‍රමාණය මත තීරණය කෙරෙන මුදලකි.

(12) ''පංගුව'' යන්නෙන්, යම් කිසි සුළු වාරිමාර්ග ව්‍යාපෘතියක හෝ ජලය ලබාගෙන ගොවිතැන් කෙරෙන යායක, කුඹුරු නාම ලේඛනයට ඇතුළත්ව ඇති ගොවීන් සංඛ්‍යාව හා කුඹුරු ඉඩම් ප්‍රමාණය ගණනය කොට, අනුපාතිකව බෙදා වෙන් කළ පසුව, ප්‍රධාන වේල්ලෙන් හෝ ඇල මාර්ගයන් වන කොටස අදහස් වේ.

(13) ''වාරි රක්ෂිතය'' යනු වාරිමාර්ග පද්ධතියේම කොටසකි. එම පද්ධතියට අයත් ඇලක්, ජල මාර්ගයක්, වැවක්, කෘෂි පාරක් හෝ පද්ධතියේ යම් අංගයකට අදාළ වන අනාගත වැඩිදියුණු කිරීම සඳහා හෝ ගංවතුර වැනි විශේෂ ආපද තත්ත්වයක් යටතේ ජල මට්ටම ඉහළ යාමක් නිසා ජලය පැතිරී යාමකට නතු වීමට ඉඩ ඇති එමෙන්ම දෙපාර්තමේන්තුවේ සේවකයින් හෝ ඉදිකිරීම්වල නිරත වන සේවකයින් හා ඔවුන්ගේ යන්ත්‍රෝපකරණවල පරිහරණය සඳහා අවශ්‍ය වන අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලබන භූමි ප්‍රමාණයකි.

02 - 866

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.